සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

54 | S | I

## දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

## Second Term Test - Grade 12 - 2020

විභාග අංකය .................................   **පෙරදිග සංගීතය I**   කාලය පැය දෙකයි

**උපදෙස්**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.
- 26 - 50 දක්වා උත්තර පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. සංගීත විෂය හදාරණ ආධුනිකයෙකු තම හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා ප්‍රගුණ කළ යුතු වන්නේ,
1. මධ්‍යලය ගීත ගායනය   2. සර්ගම් ගීත ගායනය   3. ස්වර ආභ්‍යාස ගායනය
4. ආලාප ගායනය   5. තානාලංකාර ගායනය   (........)

02. මිනිස් සිරුර තුළ ඇති ශක්ති ස්ථාන අවධිකර ගැනීමේ දී සංගීතයට සුවිශේෂී ස්ථානයක් හිමිවේ. එම ශක්ති ස්ථාන හඳුන්වනු ලබන්නේ,
1. අවධි යනුවෙනි   2. චක්‍ර යනුවෙනි   3. නිල ස්ථාන යනුවෙනි
4. යෝග ස්ථාන යනුවෙනි   5. බල ස්ථාන යනුවෙනි   (........)

03. සරිග රිගගස, රිගම ගමමරි යන ස්වර අභ්‍යාසයේ අවරෝහණ ස්වරූපයේ මුල් පියවර වන්නේ,
1. ග̇ රි̇ ස̇   ග̇ රි̇ රි̇ ස̇   2. ධ නි ස̇   ධ ස̇ ස̇ නි
3. ස̇ ධ නි   ස̇ ධ ධ නි   4. ස̇ නි ධ   නි ධ ධ ස
5. ස̇ ධ නි   ස̇ ධ ධ ස   (........)

04. රාග ජාතිය පිළිබඳ මත තුනක් දැක්වෙන්නේ,
1. බ්‍රින්දාබනී සාරංග රාගයේය   2. දේස් රාගයේය   3. බාගේශ්‍රී රාගයේය
4. තිලක්කාමෝද් රාගයේය   5. බිහග් රාගයේය   (........)

05. දේශ් රාගයෙහි වාදි සංවාදි ස්වර පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?
1. ප, රි   2. ම, ස   3. ග, නි   4. ප, ස̇   5. රි, ප   (........)

06. රාගයක <u>රි</u>, <u>ධ</u> සමග ම́ යෙදේ නම් එමර ාගය ගැයීමට සුදුසු කාලය වන්නේ,
1. සන්ධ්‍යා සන්දිප්‍රකාශ සමයයි   2. රාත්‍රී සමයයි   3. දිවා සමයයි
4. උදය සන්ධිප්‍රකාශ සමයයි   5. මධ්‍යාහ්න සමයයි   (........)

07. | නි ධ ප ම | ග රි ග ස | රි රි ම ප | නි නි ස් - | යනුවෙන් ආරම්භ වන සර්ගම් ගීතයෙහි දෙවන පාදය මින් කුමක්ද?

1. | රිං ගං රිං ස් | නි ධ ම ප | ස් නි ධ ප | ම ග රි රි |
2. | රිං ගු රිං ස් | නි ධ ම ප | ස් නි ධ ප | ම ග රි රි |
3. | රිං ගං රිං ස් | නි ධ ම ප | ස් නි ධ ප | ම ග ස - |
4. | රිං ගං රිං ස් | ස් නි ධ ප | නි ධ ප ම | ග රි ග ස |
5. | රිං ගං රිං ස් | නි ධ නි ස් | ස් නි ධ ප | ම ග රි රි | (........)

08. පහත සඳහන් ස්වර සංගති අතුරින් බාගේශ්‍රී රාගයට අදාල ස්වර සංගතිය තෝරන්න.

1. ධ̣නි̣ස, ගමධුම, මගරිස
2. ධ̣නි̣ස, ගුමධම, මගරිස
3. ධු̣නි̣ස, ගමධම, මගරිස
4. ධ̣නි̣ස, ගුමධම, මගුරිස
5. ධ̣නි̣ස, ගුමධුම, මගුරිස (........)

09. තානාලංකාර ගායනයේ දී ගීතයේ වචන යොදාගනිමින් ගයනු ලබන තාන වර්ගය කුමක්ද?

1. ගමක තාන 2. සපට් තාන 3. බෝල් තාන
4. කූඨ තාන 5. මිශ්‍ර තාන (........)

10. තබ්ලාවේ 'බායාං' කොටසින් වැයෙන අක්ෂර දෙකක් ඇතුළත් පිළිතුර කුමක්ද?

1. ති - ක 2. ගෙ - න 3. කත් - න 4. ගි - ගෙ 5. ගි - න (........)

11. තබ්ලා වාදනයක ඇතුළත් නොවන අංගය මින් කුමක්ද?

1. රේලා 2. ජලා 3. මුඛඬා 4. තිහායි 5. පරන් (........)

12. මිතියෙන් සමාන වුවද ගතියෙන් වෙනස් වන තාල යුගලය ඇතුළත් පිළිතුර කුමක්ද?

1. දදරා තාලය හා ඣප් තාලය
2. දීප් තාලය හා දාදරා තාලය
3. ත්‍රි තාලය හා එක් තාලය
4. ත්‍රිතාලය හා දීප් චන්දි තාලය
5. එක් තාලය හා චෞතාලය (........)

13. ශාස්ත්‍රීය ගායන වාදන වලදී රාගය හඳුන්වා දෙමින් රාගය ප්‍රවිෂ්ඨ වීම සඳහා ගයනු ලබන ආලාප වර්ගය කුමක්ද?

1. පූර්වාලාප 2. මධ්‍ය ආලාප 3. බඩත් ආලාප
4. සර්ගම් ආලාප 5. ආකාර් ආලාප (........)

14. '' මනා සංගීතය මිනිසාගේ ආත්මයට කතා කරන භාෂාවයි' ලෙස සංගීතය පිළිබඳ අර්ථකතනය කරන ලද්දේ මින් කවුරුන්ද ?

1. මැක්ස්වෙල් හේස් 2. රොබට් ෂුවන් 3. ප්ලේටෝ 4. බීතෝවන් 5. සාරංග දේව (........)

**ප්‍රශ්න අංක 15 සිට 20 දක්වා ප්‍රශ්න වලට පහත රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**

| **එස්රාජය** | **හාර්මෝනියම්** | **බටනලා** | **ගිටාරය** | **වයලීනය** | **සිතාරය** |
|---|---|---|---|---|---|
| A | B | C | D | E | F |

15. එකම ස්ථානයකින් ඉහළ ස්වර සහ පහල ස්වර නිපදවීමේ හැකියාව ඇති සංගීත භාණ්ඩයට අයත් අක්ෂරය කුමක්ද?

1. A 2. B 3. D 4. C 5. E (........)

16. කෝමල රිෂභය හා කෝමල ධෛවතය පිහිටුවා නොමැති එකම ආකාරයට පර්දා පිහිටුවා ඇති භාණ්ඩ යුගලය අයත් අක්ෂර ඇතුළත් පිළිතුර තොරන්න.

1. A හා C 2. F හා D 3. A හා F 4. E හා A 5. A හා B (........)

17. පෙර අපර දෙදිගම වාදනයේ දී ප්‍රධාන තැනක් හිමිකර ගන්නා තත් හතරකින් යුත් වාද්‍ය භාණ්ඩයට අදාළ අක්ෂර කුමක්ද?

1. E 2. B 3. F 4. E 5. D (........)

18. ' උස්තාල් හරිප්‍රසාද් චෞරසිය' ප්‍රසිද්ධියක් උසුලන සංගීත භාණ්ඩයට අදාල අක්ෂරය කුමක්ද?
1. E 2. C 3. C 4. D 5. A (........)

19. ස්වර වාදනයත්, තාල වාදනයත් එකවර සිදුකරගත හැකි සංගීත භාණ්ඩය අයත් අක්ෂරය කුමක්ද?
1. A 2. B 3. C 4. E 5. D (........)

20. පෙරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණයට අනුව සුෂිර වර්ගයට අයත් සංගීත භාණ්ඩ ඇතුළත් අක්ෂර වන්නේ,
1. A හා B 2. A හා D 3. B හා D 4. B හා C 5. C හා F (........)

21. දේශීය තිත් තාල පද්ධතිය ක්‍රමවත්ව සකස්කිරීමේ ගෞරවය හිමි සංගීතඥයා කවුරුන්ද?
1. සී ද එස් කුලතිලක මහතා
2. ඩබ්.බී. මකුලොළුව මහතා
3. ජේ.ඊ. සේදරමන් මහතා
4. ලයනල් රන්වල මහතා
5. වින්සන්ට් සෝමපාල මහතා (........)

22. දෙසුළු මැදුම් තුන් තිතට ගැලපෙන හින්දුස්ථානී තාලය කුමක්ද?
1. ත්‍රිතාලය 2. ලවනී තාලය 3. රූපක් තාලය 4. ඣප් තාලය 5. කෙහෙර්වා තාලය
(........)

23. 'මුව මුත්තාලතා සහ හෝ පළු වනපෙත යන සරල ශාස්ත්‍රීය ගීත දෙකෙහි තනු නිර්මාණයට පදනම් වූ රාග දෙක පිළිවෙලින් ඇතුලත් පිළිතුර කුමක්ද?
1. පීළු - බාගේශ්‍රී
2. බාගේශ්‍රී - පීළු
3. මාල්කෞන්ස් - බාගේශ්‍රී
4. දේස් - බාගේශ්‍රී
5. දේශ් - තිලක්කාමෝද් (........)

24. පහත සඳහන් ගී වර්ග අතුරෙන් මුළුමනින්ම අනාඝාතාත්මක ගී වර්ග ඇතුළත් ගී සමුච්චය තෝරන්න.
1. පාරු ගී, පතල් ගී, තුන්සරණේ ගී
2. පතල් ගී, පැල් ගී, ගොයම් ගී
3. පතල් ගී, බඹර ගී, කෙලි ගී
4. පතල් ගී, පාරු ගී, කෙලි ගී
5. පාරු ගී, පැල් ගී, ගැල් ගී (........)

25. කෝට්ටේ යුගයෙහි ආරම්භ වී මහනුවර යුගයෙහි ප්‍රචලිත වූ ගී විශේෂය කුමක්ද?
1. නාඩගම් ගීය. 2. නූර්ති ගීය. 3. සීගිරි ගීය. 4. ප්‍රශස්ත ගීය 5. දරු නැලවිලි ගීය. (........)

26. මෙලඩි (Melody) හාර්මනි (Harmony) යන සිද්ධාන්ත ප්‍රධානකරගත් සංගීත පද්ධති දෙක පිළිවෙලින් ඇතුළත් පිළිතුර කුමක්ද?
1. පෙරදිග - දේශීය
2. පෙරදිග - අපරදිග
3. අපරදිග - පෙරදිග
4. පෙරදිග - කර්ණාටක
5. හින්දුස්ථානී - කර්ණාටක (........)

27. නෙම්, බරං, ගුළු, ඩඩා ආදී වශයෙන් ස්වර සාදනය සිදුවූ සංගීත පද්ධති ඇතුළත් පිළිතුර කුමක් ද?
1. ගම්ලෑන් සංගීත පද්ධතිය
2. චීන සංගීත පද්ධතිය
3. ඉස්ලාමීය සංගීත පද්ධතිය
4. බටහිර සංගීත පද්ධතිය
5. භාරතීය සංගීත පද්ධතිය (........)

28. ගැමි ගී නිර්මාණයට පදනම් වූ මූලික කාරණා තුන වන්නේ,
1. ඇදහිලි විශ්වාස, සමාජයීය අවශ්‍යතා, පාරිසරික සාදක ය.
2. විවිධ වෘත්තීන්, ඇදහිලි විශ්වාස, ජීව විද්‍යාත්මක සාධකය
3. විවිධ වෘත්තීන්, ඇදහිලි විශ්වාස, සමාජයීය අවශ්‍යතා ය.
4. සමාජීය අවශ්‍යතා, පාරිසරික සාධක, විවිධ වෘත්තීන් ය.
5. ජීව විද්‍යාත්මක සාධක, භෞතික විද්‍යාත්මක සාධක,පාරිසරික සාධක (........)

29. C මේජර් ස්කේලයට (C major Scale) අයත් (Family chord) ෆැමිලි කෝඩ්ස් තුන ඇතුලත් පිළිතුර කුමක්ද?
1. $B^b$ F G 2. G D E 3. C F G 4. A $B^b$ G 5. $E^b$ $B^b$ $A^b$ (........)

30. සිංහලලෙන් රචිත සංගීත ග්‍රන්ථ අතර විශාලතම ග්‍රන්ථය වන 'සංගීත සංහිතා' ග්‍රන්ථය රචනා කළ කතුවරයා කවුද?

1. ආනන්ද ජයසිංහ මහතා 2. විමල් අභයසුන්දර මහතා 3. සී.ද. එස් කුලතිලක මහතා
4. බී.එස්. විජේරත්න මහතා 5. ප්‍රේමවංශ හපුවලාන මහතා (........)

**අංක 31 සිට 50 දක්වා ප්‍රශ්න සඳහා ගැලපෙන පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

31. මාතාංග නම් පඬිවරයා විසින් ................................................ නම් ග්‍රන්ථය රචනා කර ඇති අතර, භාවිතා ගීත නම් ග්‍රන්ථය .................................... මහතා විසින් රචනා කර ඇත.

32. චීන සංගීත පද්ධතියේ යුග ගණන ...................................... වන අතර එම සංගීත පද්ධතියේ ස්වර හඳුන්වන්නේ ......................................... නමිනි.

33. 'ම ප ධ ගු, ම ගු රි ස' ලෙස යෙදෙන ස්වර සංගතියෙහි පංචමය විවාදි ස්වරය වන්නේ .................................. රාගයේ වන අතර, රි ගු රි ස ලෙස යෙදෙන සංගතියෙහි ගු ස්වරය විවාදී වන නිර්දේශිත රාගය ............................................ රාගයයි.

34. ආඬිගුරු, වෙදරාල, වැනි චරිත ඇතුලත් රංග සම්ප්‍රදාය ............................................ නමින් ද, සඹේ විදානේ, ආරච්චිල වැනි චරිත ඇති රංග සම්ප්‍රදාය ......................................... නමින් ද හැඳින්වේ.

35. කෝලම් රංග ශෛලියේ රංග මණ්ඩපය ................................................ නමින් ද, නාඩගම් රඟමඬල ...................................... නමින් ද හඳුන්වයි.

36. විවිධ රටවල සංගීතය විවිධ වෙනස්කම් වලින් යුක්තවීමට බලපෑ හේතු සාධක දෙකක් ලෙස

A ............................................. B ........................................... දැක්විය හැක.

37. | උ ද S | ය ට S | පා S S | ය න S |

| හි රූ S | දෙ වි S | ය S න් | ට යි S | යන ජන ගී පාදයේ ගීමත් සංඛයාව ...................................... ක් වන අතර සැදැස්මස් සංඛ්‍යාව ......................................... වේ.

38. 'වාසනා දිනේකි මේක යන නූර්ති ගීතය තාල රූප දෙකකට අනුව ගැයේ. එනම් ................................. තාලය සහ ......................................... තාලයයි.

39. | x x | x x x | x x | x x x | ලෙස මාත්‍රා බෙදෙන හින්දුස්ථානී තාලය .................................. වන අතර, දේශීය තිත ................................................ වේ.

40. වෛද ගීතිකා ගැයීම ...................................... අනුදාත්ත සහ ...................................... වශයෙන් නාද ස්ථාන තුනක් මත සිදු කර ඇත.

41. 14 වන ශතවර්ෂයෙන් පසුව එල්ල වූ මෝගල් ආක්‍රමණ හමුවේ භාරතීය සංගීතය ................................. හා ................................................ වශයෙන් දෙකඩ විය.

42. රාගයන් ඉදිරිපත් කිරීමේදී නිර්මාණාත්මකව, ක්ෂණිකව ගොඩනගාගන්නා නාද විග්‍රහ ...................................... ලෙස ද තිහායි සහිත වූ යම්කිසි පද කොටසක් තෙවරක් වාදනයකොට සමස්ථානයට පැමිණීම ................................... ලෙස ද හඳුන්වයි.

43. 'සුරතට රැගෙන පන්දම යාගෙට ඇදුරා යන ගීතය ..................................... ශාන්ති කර්ම සම්ප්‍රදායට අයත් වන අතර, ගුණ දැනේ බෝසත් අනේ ......................................... ශාන්ති කර්ම සම්ප්‍රදායට අයත් ගීතයකි.

44. උච්ච ෂඩ්ජයේ කම්පන සංඛයාතය 512 $H^z$ ක් නම් මධ්‍ය ෂඩ්ජයේ සහ මධ්‍ය පංචමයේ කම්පන සංඛයාතය වන්නේ පිළිවෙලින් ....................................... හා ................................. ය.

45. 'පැට්ටි අඬන්නේ මොන්නට දෝ බොල' යන ගැමි ගීතය ............................................. වන අතර, එම ගී අනුසාරයෙන් නිර්මාණය වූ සරල ගීතයක් ලෙස ............................................. ගීතය දැක්විය හැක.

46. ශ්‍රී ලංකීය ප්‍රසිද්ධ ශාස්ත්‍රීය වයලින් වාදන ශිල්පියෙකු ලෙස ................................................ මහතා ද, තබ්ලා වාදන ශිල්පියෙකු ලෙස .................................. මහතා ද දැක්විය හැක.

47. දේශීය තිත් තාල පද්ධතිය අනුව තනි තිතේ සහ තුන් තිතේ ප්‍රභේද සංඛ්‍යාව පිළිවෙලින් ලියන්න.

.............................................................................................. , ..............................................................................................

48. තාලයක වඩාත් ප්‍රබල ආඝාතය කුමන නමකින් හැඳින්වේද? ඒ සඳහා යොදන සංකේතය ද ලියන්න.

.............................................................................................. , ..............................................................................................

49. උත්තර භාරතීය සංගීතයෙහි ගාන සමය පිළිබඳ විමසීමේදී දිවා 12 සිට රාත්‍රී 12 දක්වා ගැයෙන රාග ................................................................ රාග ලෙසද, රාත්‍රී 12 සිට දිවා 12 තෙක් ගැයෙන රාග ........................................................... රාග ලෙස ද හඳුන්වයි.

50. තාලම්පට වාදනයේ දී නැගෙන ධ්වනීන් දෙකට අයත් සංකේත දෙක ................................................. සහ .................................................... වේ.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

54 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය ................................ පෙරදිග සංගීතය II කාලය පැය තුනයි

වැදගත්
I කොටසින් ප්‍රශ්න දෙකකට ද II කොටසින් ප්‍රශ්න එකකට ද III වන කොටසින් ප්‍රශ්න දෙකකට ද ආදී වශයෙන් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

## I කොටස

01. පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග තුනකට අදාල ස්වර සංගතීන් ය.

a. රිමප මපධ, රිමපධ මගරි ගනිස
b. ගුමධනිස, (ස) නිධ, මපධ ගු, මගුරිස
c. රිමප මග, සරිග සනි, පනිසරිගස

i. ඉහත ස්වර සංගතීන් අයත් වන රාග තුන පිළිවෙලින් නම් කරන්න. (ල. 6)

ii. ඉහත රාග අතුරින් ආරෝහණයේ දී ග,ධ, දුර්වලව යෙදෙන අවරෝහණයේ දී දීර්ඝභය වක්‍රව යෙදෙන රාගය නම්කර එහි බයාල් ගීතයක හෝ වාදිතයක ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කර ඊට අදාලව මාත්‍රා අටකට නොඅඩු තානාලංකාර දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කරන්න. (ල. 8)

iii. ඉහත A,B,C රාග අතුරින් විවාදී ස්වරයක් ලෙස පංචමය යොදාගන්නා රාගය නම් කර එහි ආරෝහණ, අවරෝහණ, වාදී, සංවාදී, මුඛ්‍යාංගය, ගාන සමය යන රාග විස්තර ලියා දක්වන්න. (ල. 06)

02. i. නිර්දේශිත රාග අතුරින් ඛමාජ් මේලගත සමප්‍රකෘති රාග යුගලය නම් කරන්න. (ල. 02)

ii. ඉහත සමප්‍රකෘති රාග යුගලයෙහි සමවිෂමතා පිළිබඳ කරුණු පහක් සංසන්දනාත්මකව ලියා දක්වන්න. (ල. 04)

iii. ඉහත රාග අතුරින් එක් රාගයක් නම්කර එම රාගයට අදාලව ආලාප ඛණ්ඩයක් ස්වර 20 කට නොඅඩු වන සේ ලියා, එම රාගයට අදාලව මාත්‍රා 08 කට නොඅඩු තානාලංකාර දෙකක් නිර්මාණය කරන්න. (ල. 04)

iv. රාගධාරී සංගීතයෙහි භාවිතා වන ආලාප වර්ග දෙකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 04)

03. පහත වගුව උපයෝගී කර ගනිමින් පිළිතුරු සපයන්න.

| | ශිල්ප ක්‍රම ඇතුලත් ස්වර ඛණ්ඩය | ශිල්ප ක්‍රමය |
|---|---|---|
| A | ස ම, මගුරිස, ගුම, ධ ම ගු | |
| B | $^{\text{ස}}$නි̣ස, $^{\text{ස}}$මගුරිස, $^{\text{ස}}$නි̣ ධ ස, $^{\text{ස}}$මගු, $^{\text{ස}}$රිස | |
| C | නි̣සගම (ප) ගමග-ස, (ස) නි̣පනි̣ස | |
| D | මමගු මමගු මමගුගුරිස | |
| E | $^{X}$ගුගු රිස නිස ගුම / $^{2}$ප- -- ගුගු රිස / $^{0}$නිස ගුම ප- -- /$^{3}$ගුගු රිස නිස ගුම /$^{X}$ප | |

i. ඉහත වගුවෙහි ඇති ස්වර ඛණ්ඩ ලියා ඇත්තේ රාගධාරී සංගීතයෙහි භාවිතා කර සුවිශේෂී ශිල්ප වලට අනුවය. එක් එක් ස්වර ඛණ්ඩයට අදාල ශිල්පක්‍රමය ඉංග්‍රීසි අක්ෂරයද සමඟ ලියා දක්වන්න. (ල. 05)

ii. ඉහත E අක්ෂරයට හිමි ස්වර ඛණ්ඩය ගායනයේදී වාදනය කළ යුතු හින්දුස්ථානී තාලය නම්කර, එම තාලය සම, දෙගුණ වශයෙන් නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 07)

iii. 'නාදීර් දීර් දීම්ත දෙරෙ දානී' ආදී වශයෙන් වචන යෙදෙන හින්දුස්ථානී ගායන ශෛලිය නම්කර එම ගායන ශෛලියට අදාල විශේෂ කරුනු තුනක් ලියා දක්වන්න. (ල. 06)

iv. තානාලංකාර වර්ග දෙකක් නම්කර උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 04)

## II කොටස

04. පහත සඳහන් වගුව ඇසුරින් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| | රංග සම්ප්‍රදායට අයත් විශේෂ ලක්ෂණ | රංග සම්ප්‍රදාය |
|---|---|---|
| A | අනුරූපන මාධ්‍යයෙන් කථාවක් කීම | |
| B | තබ්ලා, වයලීනය, හාර්මෝනියම් වැනි සංගීත භාණ්ඩ යොදාගනී. | |
| C | කර්නාටක සංගීතයේ ආභාෂය ලබා ඇත. | |
| D | උඩරට ගැටබෙරය සහ සමහර පළාත්වල දවුල යොදාගනී. | |
| E | ගායනාවල පහතරට යාග ගී ආභාෂය ඇත. | |
| F | අඩුතාල සහ වැඩිතාල වාදනයට මද්දලය යොදාගනී. | |
| G | උතුරු ඉන්දියානු රාගධාරී සංගීතයේ ආභාෂය ලබා ඇත. | |
| H | නළුවන් රංග භූමියට පිවිසෙන්නේ වෙස් අත්ත දෙපසිනි. | |

i. ඉහත වගුවෙහි දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් 04 කට අයත් විශේෂ ලක්ෂණ වන අතර, එම රංග සම්ප්‍රදායන් නම් කර වගුවෙහි දැක්වෙන තොරතුරු එම රංග සම්ප්‍රදායන් යටතේ ලියා දක්වන්න. (ල. 04)

ii. ඉහත B සහ F අක්ෂරයන්ට අයත් රංග සම්ප්‍රදායන් දෙක පිළිබඳව කරුණු හතරක් ඇසුරින් සංසන්දනය කරන්න. (ල. 04)

iii. මහනුවර යුගයේ රාජ සභාවට අයත් සංගීත හා නැටුම් ආයතන හතරක් නම් කරන්න. (ල. 04)

iv. ඉහත එක් සංගීත ආයතනයකට සම්බන්ධ කාර්නාටක සංගීතඥයකු නම් කර එම සංගීත ආයතනය ඇසුරේ ආරම්භ වූ ගායන විධි තුනක් නම් කරන්න. (ල. 04)

v. ඉහත එක් ගායන විධියකට අයත් ගීතයක ස්ථායි කොටස ලියා දක්වන්න. (ල. 02)

05. පහත දක්වා ඇත්තේ ගැමි ගීත කිහිපයක මුල් ගීත පාදයන්ය. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| | ගැමි ගීත වල ගීත පාදයන් | ගීත වර්ගය |
|---|---|---|
| A | වෙල්යායක ගොන්දෙන්නෙක් කකා උනී | |
| B | සුරතට රැගෙන පන්දම යාගෙට ඇදුරා | |
| C | පැට්ටි අඬන්නේ මොන්නට දෝ බොල | |
| D | උපත පෙරා කළිඟු පුරා | |
| E | ගුණ දැනේ බෝසත් අනේ | |
| F | උදයට පායන හිරු දෙවියන්ටයි | |

i. ඉහත වගුවෙහි දැක්වෙන ගීත පාදයන් අයත් ගීත වර්ගය ඉංග්‍රීසි අක්ෂරය සමඟ ලියා දක්වන්න. (ල. 06)


ii. දේශීය ජන සංගීතාංගයක් වන ගැමි ගීතය තුලින් ගැමි ජන ජීවිතයේ පැවති සංස්කෘතික සහ සාමාජීය වටිනාකම් මනාව පිළිබිඹු වේ. මෙම කරුණා සම්බන්ධයෙන් පහත ශීර්ෂ ඔස්සේ උදාහරණ දක්වමින් පුවත් පතකට ලිපියක් සකස් කරන්න.

- සාමුහික බව දනවන අවස්ථා
- දාර්ශනික බව පෙන්නුම් කරන අවස්ථා
- සන්නිවේදන කාරකයක් ලෙස
- සාරධර්ම අගයන් පිළිබඳව (ල. 06)

iii. දේශීය තාල පද්ධතිය තුළ දෙතිතට අයත් තිත් රූප ගණන සහ එම තිත් රූප නම ලියා දක්වන්න. (ල. 08)

## III කොටස

06. පහත දැක්වෙන අපරදිග ප්‍රස්තාර කොටස ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



i. අංක 1 - 8 දක්වා අංකනය කර ඇති සංකේත නම් කරන්න. (ල.05)

ii. මෙම ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරලා ප්‍රස්තාර කරන්න. (ල.12)

iii. පෙරදිග ක්‍රමයට සැකසූ ප්‍රස්තාරය පංචම භාවයෙන් යුතුව නැවත ලියන්න. (ල.03)

07. හින්දුස්ථානි සංගීතය තුළ ශාස්ත්‍රීය වාදන සඳහා භාවිතා වන සංගීත භාණ්ඩ කිහිපයක් පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

- ශබීර් හුසේන් ශිල්පියා මෙම භාණ්ඩය වාදනයට ප්‍රසිද්ධියත් උසුලයි.
- දූරජ් කොටසේ නියමිත පරිදි ජවාරි නොතිබීමෙන් මිහිරි නාදයට හානියක් වේ.
- ගට් (Gut) කොටස එන්ඩ්පින් (Endpin) කොටස හා සම්බන්ධ වේ.
- පණ්ඩිත් රවිශංකර් ශිල්පියා මෙම භාණ්ඩය වාදනයට ප්‍රසිද්ධිය උසුලයි.
- සුසර කිරීම සඳහා ගට්ටා නම් කොටස භාවිතා කරයි.
- තත් රඳවනය ලංගෝට් නම් වන අතර තත් දරණකය සෝඩ් නම් වේ.
- Sound Hole (Fhole) නම් කොටසක් ඇත.
- ආචාර්ය N. රාජම් ශිල්පිනිය වාදනයට ප්‍රසිද්ධියක් උසුලයි.
- පණ්ඩිත් අෂිෂ්චන්ද්‍ර බෙනර්ජි සහ රවීන්ද්‍රනාත් තාගෝර්තුමා වාදනයට ප්‍රසිද්ධියක් උසුලයි.
- ප්‍රධාන තත් 'නායකීතාර්' ලෙස හඳුන්වන අතර මක්කා මගින් සියුම්ව ස්වර සුසර කර ගනී.
- ප්‍රධාන තත් 'බාජ්කාතාර්' නම් වන අතර එය ම සාරයට සුසර කරයි. (ල. 12)

i. ඉහත තොරතුරු වලට අදාල සංගීත භාණ්ඩ හතර නම් කර එක් එක් භාණ්ඩයට අදාල කරුණු ඒ යටතේ ලියා දක්වන්න. (ල. 08)

ii. ඉහත භාණ්ඩ අතුරින් ඔබ කැමති එක් සංගීත භාණ්ඩයක ව්‍යුහය සහ ඉහළ ගුණාත්මක තත්වයකින් පවත්වා ගැනීමට අනුගමනය කළ යුතු කරුණු පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ල. 04)

iii. විශ්ව සංගීතයේ පිළිගත් සංගීත පද්ධති හතරක් නම් කරන්න. (ල.04)

08. i. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

a. ශාස්ත්‍රීය ගායන ශිල්පයකු සඳහා කටහඬ පාලනය සහ නිවැරදි ඉරියව්වල ඇති වැදගත්කම

b. සංගීත අධ්‍යාපනය සඳහා අන්තර්ජාල භාවිතය.

c. දේශීය තාල පද්ධතිය ගොඩනැගෙන අයුරු

d. ශ්‍රී ලංකාවේ ජන ගී වර්ගීකරණය (ල. 12)

ii. ඔබ උගත් රාගධාරී ශාස්ත්‍රීය පදනමක් සහිත සිංහල සරල ගීතයක් පිළිබඳ විචාරත්මක ඇගයීමක් කරන්න.

# දෙවන වාර පරීක්ෂණය - 2020
# පෙරදිග සංගීතය 12 ශ්‍රේණිය
## I පත්‍රය

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 2 | 21. | 2 |
| 2. | 2 | 12. | 5 | 22. | 3 |
| 3. | 4 | 13. | 1 | 23. | 1 |
| 4. | 3 | 14. | 1 | 24. | 5 |
| 5. | 5 | 15. | 4 | 25. | 4 |
| 6. | 1 | 16. | 3 | 26. | 2 |
| 7. | 2 | 17. | 1 | 27. | 1 |
| 8. | 4 | 18. | 2 | 28. | 3 |
| 9. | 3 | 19. | 5 | 29. | 3 |
| 10. | 4 | 20. | 4 | 30. | 2 |

1 x 25 = 25

31. බදුහන්දේසි, වින්සන්ට් සෝමපාල මහතා
32. 4, ලියු (Lu)
33. භාගේශ්‍රී, දේස්
34. සොකරි, කෝලම්
35. තානායම්පොල, කරලිය
36. භාෂාව, දේශගුණය ආදී වශයෙන්
37. 16, 24
38. කෙහෙර්වා, බෙම්ටෝ
39. ජප් තාලය, සුළු මැදුම් දෙතිත
40. උදාත්ත, ස්වරිත
41. හින්දුස්ථානි, කර්නාටක
42. උපජ්, චක්‍රදාර්
43. උඩරට, පහතරට
44. 256 , 384
45. වැදි, නංගිට බැඳපු මල්වියනයි, මාමිනි මා දෙයියා, ආදී වශයෙන්
46. නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න.
47. 3 , 7
48. සමග්‍රහ, X
49. පූර්ව රාග, උත්තර රාග
50. තිත්, තෙයි ( ^, / )

01. (i) A දේස් B භාගේශ්‍රී C තිලක්කාමෝද් (ල. 6)
(ii) දේස් රාගයට අදාලව පිළිතුරු සැපයීමට (ල. 8)
(iii) භාගේශ්‍රී රාගයෙහි රාග විස්තර හට ලිවීමට (ල. 6)

02. (i) දේස් - තිලක්කාමෝද් (ල. 2)
(ii) කරුණු 05 ක් සංසන්දනය සඳහා (ල. 10)
(iii) ආලාප එතෝඩය සහ තානාලංකාර (ල. 04)
(iv) ආලාප වර්ග දෙකක් පැහැදිලි කිරීමට (ල. 04)

03. (i) A මීන්ඩ් B කන්ස්වර C මුර්කි D ගමක් E තිහායි (ල. 06)
(ii) ත්‍රිතාලය - සම දෙගුණ වශයෙන් ලිවීමට (ල. 07)
(iii) තරානා ගායන ශෛලිය - තරානා ගායන ශෛලිය පිළිබඳ කරුනු තුනක් ලිවීමට (ල. 04)
(iv) තානාලංකාර වර්ග දෙකක් නම් කර පැහැදිලි කිරීමට (ල. 04)

04. (i) සොකරි - A, D කෝලම් - E, H නාඩගම්- C, F නූර්ති- B, G (ල. 06)
(ii) නූර්ති හා නාඩගම් පිළිබඳ සංසන්දනය කිරීමට (ල. 04)
(iii) සංගීත හා නැටුම් ආයතන 04 නම් කරන්න. (ල. 04)
(iv) ගණිතාලංකාර, අලගනායිදු වැනි සංගීතඥින්ගේ ආභාෂයෙන් ආරම්භ වූ ගායන ක්‍රම 03 ක් සහ සංගීතඥයකු නම් කිරීමට (ල. 04)

05. (i) A පැල් ගී B උඩරට ශාන්තිකර්ම ගී C වැදි ගීත D පහතරට ශාන්තිකර්ම ගීත
E සබරගමු ශාන්තිකර්ම F ගොයම් ගීත (ල. 06)

(ii) අදාල කරුණු ඇතුලත්ව ලිපිය ලිවීමට (ල. 12)

(iii) තිත් රූප 03 යි

සුළු මැදුම් දෙතිත, මැදුම් මහ දෙතිත, සුළු මහ දෙතිත (ල. 02)

06. i.

| | |
|---|---|
| 01. ට්‍රෙබල්ක්ලෙෆ් | (Treble clef) |
| 02. ටයිම් සිග්නේචර් | (Time signature) |
| 03. ක්‍රොචට් රෙස්ට් මාක් | (Crutcher Rest mark) |
| 04. සෙමි ක්වෙවර් | (semi quaver) |
| 05. ටයි | (Tie / bind) |
| 06. ඩොටඩ් මිනිම් | (Dotted minim) |
| 07. සෙමිබ්‍රේව් | (Semibreve) |
| 08. මිනිම් රෙස්ට්මාර්ක් | (minim Restmark) |

ii. + සග ග ප / ම - මධ ම / ප - ග රි / - රි ස - /
ග පප නි - / ග් - - නිනි / + + ග - / ස - - - /

iii. + පනි නි රි් / ස් - ස්ග් ස / රි් - නි ධ / - ධ ප -
නි රි්රි් ම - / නි් - - ම් ම් /+ + නි - / ප - - -

07. i. තබ්ලාව, සිතාරය, වයලීනය, එස්රාජය (ල.12)
ii. නිවැරදි පිළිතුර සඳහා (ල.04)
iii. සංගීත පද්ධති හතර නම් කිරීමට (ල.04)

08. i. මාතෘකා දෙකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කිරීමට (ල.12)
ii. තෝරාගත් ශාස්ත්‍රීය සරල ගීතයේ අඩංගු රාගධාරී අංග පිළිබඳ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල.08)

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




- Past Papers
- Model Papers
- Resource Books

for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

HOME DELIVERY

CASH ON DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440